## ඒකදේවවාදයෙන් බහුදේවවාදයට

ක්‍රිස්තුස් වහන්සේ ආගමක් දේශනා කෙළේ ද යන්න ම ඇතැම් දෙනා නගන ප්‍රශ්නයක් වී ඇත. ක්‍රිස්තුස් වහන්සේ යුදෙව්වන්ට හා ඔවුන්ගේ ආගමට විරුද්ධව ඇතැම් ක්‍රියාවල යෙදුණ නමුත් එතුමා ආගමක් දේශනා නොකළ බවත් එය ආගමක් බවට පත්වූයේ පසු කලෙක බවත් ඒ අයගේ මතය වෙයි. නිසැකව ම කුරුසිය ආගමික සංකේතයක් බවට පත් වී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමෙන් පසුව බව පැහැදිලි ය. එහෙත් අනෙක් කරුණු සම්බන්ධයෙන් ද අපට එසේ කිව හැකි ද?

අපි පළමුවෙන් ම ක්‍රිස්තුස් වහන්සේ යුදෙව් ආගමෙන් හා යුදෙව් සංස්කෘතියෙන් වෙනස්වන්නේ කෙසේ දැයි විමසා බලමු. යුදෙව්වෝ එක දේවත්වයක් විශ්වාස කළහ. ඔවුන්ට අනුව යෙහෝවා දෙවියන් වහන්සේ ලෝකය මැවූහ. මේ මැවීම පරණ තෙස්තමේන්තුවේ උත්පත්ති කතා දෙකෙන් විස්තර කෙරෙයි. (ඇතැම් අයට මේ උත්පත්ති කතා දෙක අමතක වෙයි. ඔවුන් සිතන්නේ බයිබලයේ ඇත්තේ එක් උත්පත්ති කතාවක් පමණක් බව ය.) යෙහෝවා දෙවියන් වහන්සේ හැරෙන්නට වෙනත් දෙවිවරු යුදෙව්වන්ට නො වූහ. එනම් ඔවුහු බහු දේවත්වය නො පිළිගත්හ. ග්‍රීකයෝ ද රෝමයෝ ද දඹදිව් වැසියෝ ද බහු දේවවාදී වූහ. එක දේවවාදය රෝමයන්ට මෙන් ම දඹදිව් වැසියනට ද බටහිර ආසියාවෙන් පැමිණ ඇති බව පැහැදිලි ය.

යුදව්වන්ට යෙහෝවා දෙවියන් වහන්සේ හැරෙන්නට සුර දූතයෝ හා සුර දූතිකාවෝ වූහ. එහෙත් සුර දූතයෝ හා සුර දූතිකාවෝ කිසි විටෙකත් දෙවියන් වහන්සේට සම නො වූහ. දෙවියන් වහන්සේ, සුර දූතයන්, සුර දූතිකාවන් හැරුණු විට යුදෙව්වන්ට අනාගත වක්තෘවරු (Prophets) සිටියහ. මේ අනාගත වක්තෘවරු මනුෂ්‍යයෝ වූහ. ඔවුන්ට දේවත්වයක් නො තිබිණි. ඉස්ලාම් ආගමේ ද අනාගත වක්තෘවරු වෙති. ඉස්ලාම් ආගමට අනුව ක්‍රිස්තුස් වහන්සේ මෙන් ම මහමත්තුමා ද අනාගත වක්තෘවරු වෙති. එයින් මහමත්තුමා අවසාන අනාගත වක්තෘ වෙයි.

ක්‍රිස්තුස් වහන්සේ තමන් දෙවියන් වහන්සේගේ පුතා බවත් තමන් දෙවියන් වහන්සේ බවත් ප්‍රකාශ කෙළේ යැයි කියැවෙයි. මේ කියමන යුදෙව්වන්ගේ සිත්ගත් එකක් නොවන බව පැහැදිලි ය. යුදෙව්වන්ට දෙවියන් වහන්සේට සමකළ හැකි කිසිවෙක් නො වී ය. එබැවින් ක්‍රිස්තුස් වහන්සේ තමන් දෙවියන් වහන්සේ බවත් එමෙන් ම උන්වහන්සේගේ පුතා බවත් කියන විට යුදෙව්වන්ට ඇති වන හැඟීම සිතාගත හැකි ය.

දැන් ප්‍රශ්නයක් පැන නගියි. ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේ දෙවියන් වහන්සේ හා පුතා බවත් දෙවියන් වහන්සේ හා පියා බවත් ශුද්ධාත්මය බවත් ප්‍රකාශ කෙළේ ද. යන්න ඒ ප්‍රශ්නය වෙයි. වෙනත් වචනවලින් කිවහොත් උන්වහන්සේ ශුද්ධ ත්‍රිත්වය (Holy Trinity) යන යෙදුම යොදාගත්තේ ද? අපි මෙයට දැනට එක් පිළිතුරක් දී ඇත්තෙමු. එනම් උන්වහන්සේ එසේ ප්‍රකාශ කළ බවත් එහි දී උන්වහන්සේට භාරතීයයන්ගෙන් ආභාසය ලැබුණු බවත් ය. භාරතීයයන්ගේ බ්‍රහ්මන් හා සම්බන්ධ ත්‍රිමූර්තිය මෙහි දී උන්වහන්සේට බලපාන්නට ඇතැයි අපි කීවෙමු.

එහෙත් මෙයට දෙවැනි පිළිතුරක් ද වෙයි. ඒ පිළිතුර තරමක් සංකීර්ණ ය. එහෙත් අප එය ද සලකා බැලිය යුත්තේ දැනුම නිර්මාණය හා විශේෂයෙන් ම බටහිර විද්‍යාව නිර්මාණය සම්බන්ධයෙන් ඒ වැදගත් බැවිනි. කිනම් ආකාරයකට බැලුවත් ක්‍රිස්තුස් වහන්සේ යුදෙව්වන්ට විරුද්ධ වූ බැවින් උන්වහන්සේගේ ගෝලයන්ට ක්‍රිස්තුස් වහන්සේ කියා දුන් දේ යුදෙව්වන් නොවූවන් අතර ප්‍රචාරය කරනු හැරෙන්නට විකල්පයක් නො වී ය. ක්‍රිස්තුස් වහන්සේ ද තම ගෝලයන්ට කියා ඇත්තේ යුදෙව්වන් නොවන්නන් අතරට යන ලෙස ය.

ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන්ගෙන් පීතර හා පාවුළු යන දෙදෙනා රෝමයට ගොස් ඇත. ඇතැම් විට ඔවුන්ට ඒ සඳහා පිලාතේ නම් රෝම ආණ්ඩුකාරවරයා පිහිට වන්නට ද ඇත. රෝම ආණ්ඩුකාරවරයා ඒ ගෝලයන් දෙදෙනා යුදෙව්වන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන් රෝමයට යවන්නට ඇතැයි ද සිතිය හැකි ය. කෙසේ ගිය ද ඔවුන් දෙදෙනා රෝමයට යන විට කුමක් සිදුවන්නට ඇත් ද? ක්‍රිස්තුස් වහන්සේ දේශනා කළ දෙවියන් වහන්සේ කවුරුන් වන්නට ඇත් ද? ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ සංකල්පය උන්වහන්සේට තිබෙන්නට ඇත් ද?

ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ සංකල්පය ක්‍රිස්තුස් වහන්සේට භාරතයෙන් ලැබිණි යැයි අපි සිතමු. අපේ පළමු පිළිතුර ඒ වටා ගෙතුණු එකක් වෙයි. අපි දැන් වෛදිකයන්ගේ ත්‍රිමූර්තිය පිළිබඳ සංකල්පය විමසා බලමු. ත්‍රිමූර්තිය පිළිබඳ සංකල්පය ඒකදේවවාදයක් බහුදේවවාදයක් ඇති රටකට අවශෝෂණය කිරීමේ දී නිර්මාණය වන්නක් ලෙස සැලකිය හැකි ය. බහුදේවවාදී රටක් (ප්‍රදේශයක්) වූ පැරණි දඹදිව බටහිර ආසියාවෙන් පැමිණි ඒකදේව

© Prof. Nalin De Silva

නිර්මාණවාදය ඒ ලෙස ම පිළිගත්තේ යැයි සිතිය නො හැකි ය. ලෝකය නිර්මාණය කළ දෙවියන් වහන්සේ දඹදිව දී ලෝකයත් සමග ගැටෙන ලෝකයත් සමග එකට ක්‍රියා කරන දෙව් මඬුල්ලක් බවට පත් වී ඇත. ලෝකය නිර්මාණය කර පැත්තකට වී නොසිටින මේ දෙවියන් වහන්සේ දඹදිව දී ලෝකයත් සමග ක්‍රියාකරන ලෝකය පවත්වාගෙන යන දෙවියන් කිහිප දෙනකු බවට පත්කරගෙන ඇත.

එක බ්‍රහ්මන් හෙවත් දෙවියන් වහන්සේ දඹදිව දී ශිව, විෂ්ණු, ඊශ්වර යන දෙවියන් තුන්දෙනකු බවට පත් වී යැයි අපට නිගමනය කළ හැකි වෙයි. එසේ කිරීමෙන් බහුදේවවාදය ද රැකගැනීමට දඹදිව වැසියනට හැකි විය. ශිව ලෝකය මවන්නා ලෙසත් විෂ්ණු ලෝකය පවත්වගෙන යන නිතර ලෝකයට පැමිණෙන්නා ලෙසත් ඊශ්වර ලෝකය විනාශ කරන්නා ලෙසත් ගැනීමෙන් එක් දෙවියන් වහන්සේ කෙනකු වෙනුවට දෙවියන් තුන් දෙනකු ඇතිකර ගැනීමට දඹදිව වැසියෝ තම අවශෝෂනය ඔස්සේ සමත් වූහ. ඒ අතර ඔවුන්ට අර එකදේවවාදය ද මුළුමනින් ම බැහැර කිරීමට නො හැකි විය. එබැවින් ඔවුහු ඒ දෙවියන් තිදෙනා එක් බ්‍රහ්මන් කෙනකුගේ ත්‍රිමූර්තිය ලෙස සැලකිමට පුරුදු වූහ. ත්‍රිමූර්තිය යන සංකල්පය එලෙස එකදේවවාදයක් බහුදේවවාදී සංස්කෘතියකට අවශෝෂණය කිරීමේ නිර්මාණය වූවක් ලෙස සැලකිය හැකි ය.

මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. එලෙස එකදේවවාදයක් අවශෝෂණය කිරීමේ දී දඹදිව එතෙක් පැවති චින්තනය හා සංස්කෘතිය ද වෙනස් විය. එලෙස වෙනස් වීමෙන් ලැබුණේ වෛදික සංස්කෘතියක් හා චින්තනයක් විය. ඒ තවදුරටත් පැරණි දඹදිව සංස්කෘතිය හෝ අදාළ චින්තනය හෝ නො වී ය. බ්‍රහ්මන් එක් දෙවියෙක් මෙන් ම එක් දෙවියෙක් පමණක් නො වී ය. එහි දී ත්‍රිකෝටික න්‍යාය යොදා ගැනෙන බව පැහැදිලි ය. ඒ ප්‍රශ්නයක් නොවිය යුත්තේ ලෝකයේ ඇත්තේ ද්විකෝටික ඇරිස්ටෝටලීය න්‍යාය පමණක් නොවන බැවිනි.

ක්‍රිස්තුස් වහන්සේ යුදෙව්වන් අතර තමන් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව කියන විට දෙවියන් වහන්සේ හා තමන් වහන්සේ එක් අයකු බව කියන්නට ඇතැයි සිතිය හැකි ය. එසේ කීමෙන් උන්වහන්සේ යුදෙව්වන්ගේ වෛරයට පාත්‍ර වුවත් එකදේවවාදය ආරක්‍ෂා කරගන්නට ඇත. දෙවියන් වහන්සේ හා පියා සහ දෙවියන් වහන්සේ හා පුතා යනු දෙදෙනකු නො වේ යැයි කීම යුදෙව් චින්තනයට පටහැණි වන්නේ වියුක්තය සංයුක්තය බවට පත්කිරීමෙන් මිස එකදේවවාදයට විරුද්ධ වීමෙන් නො වේ.

ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන්ට රෝමයට ගෙන යෑමට සිදුවූයේ මේ එකදේවවාද සංකල්පය ය. එහෙත් රෝම සංස්කෘතිය ග්‍රීක සංස්කෘතිය මෙන් ම බහුදේවවාදී සංස්කෘතියක් විය. එකදේවවාදයක් බහුදේවවාද සංස්කෘතියකට ගෙන ඒමේ දී ඇතිවන විරුද්ධතාව එහි දී ද ඇතිවිය. ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන් පිලාතේ ආණ්ඩුකාරයාගේ පිහිටෙන් රෝමයට පැමිණිය ද නැත් ද, රෝමයෝ ඒ ගෝලයන්ට කෙසේ වෙතත් ඔවුන්ගේ එකදේවවාදය පිළිගත් ක්‍රිස්තියානීන්ට විරුද්ධ වූහ. ඔවුහු ක්‍රිස්තියානීන් වධයට භාජනය කළහ. රෝමයෝ තම කොලෝසියම් නමින් හැඳින්වුණු විශාල වටරවුම් ක්‍රීඩාංගනවල දී ක්‍රිස්තියානින් වෙතට සිංහයන් මුදාහැර විනෝද වූහ.

එහෙත් මේ සියලු වධහිංසා අතර රෝමයෙහි ක්‍රිස්තියානිය ක්‍රමයෙන් පැතිර ගියේ ය. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් අවුරුදු පනහක් වන විට රෝමයේ ක්‍රිස්තියානි ජනතාවක් විය. ඒ ක්‍රිස්තියානීන්ගෙන් කොපමණ දෙනා වහලුන් විණි දැයි අපි නො දනිමු. ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම්වලට පීඩිතයන් ආකර්ෂණය වන්නට ඇත. ඒ කෙසේ වෙතත් ක්‍රිස්තියානීන්ට රෝමය ස්වර්ගයක් නොවූ බව පැහැදිලි ය. රෝමයන්ගෙන් පැමිණි බලපෑම් යටතේ ක්‍රිස්තියානින් දෙයාකාරයකට ප්‍රතිචාර දක්වා ඇත.

පළමු ප්‍රතිචාරය පැහැදිලි ය. ක්‍රිස්තියානීන් එකදේවවාදය අත්හැර බහුදේවවාදය පිළිගැනීම ඒ ප්‍රතිචාරය ය. එකදේවවාදයක් බහුදේවවාදයක් බවට පත්වන්නේ පත්කරගන්නේ කෙසේ ද? ඒ සඳහා උදාහරණයක් භාරතයෙන් (දඹදිවෙන්) ලැබෙයි. ඒ එක් දෙවියන් වහන්සේ වෙනුවට දෙවියන් තුන්දෙනකු හෝ කිහිප දෙනකු ඇතිකරගැනීමත් ඒ අතර අර දේව සමූහයා එකම දෙවියන් වහන්සේ ලෙස සැලකීමත් ඒ ප්‍රතිචාරය වෙයි. රෝමයේ විසූ ක්‍රිස්තියානීන් (මෙහි දී ක්‍රිස්තුස් වහන්සේ නො වේ) භාරතයෙන් ආභාසය ලබන්නට ඇත. එසේත් නැත්නම් තමන් ම ස්වාධීනව ප්‍රතිචාරයක් දක්වන්නට ඇත. ඒ කෙසේ වෙතත් ක්‍රිස්තියානීන් ශුද්ධ වූ ත්‍රිත්වය තම පිළිතුර ලෙස නිර්මාණය කර ඇති බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

ශුද්ධ වූ ත්‍රිත්වය යන සංකල්පයෙන් කියැවෙන්නේ යුදෙව්වන්ගේ යෙහෝවා නම් වූ දෙවියන් වහන්සේ එකම දෙවියන් වහන්සේ ලෙස පවතිමින් ම දෙවියන් තුන්දෙනකු වන්නේ කෙසේ ද යන්න ය. එකම දෙවියන් වහන්සේ, බහුවිධ වී දෙවියන් වහන්සේ හා පියා, දෙවියන් වහන්සේ හා පුතා සහ ශුද්ධ වූ ආත්මය යන දෙවියන් තිදෙනා ලෙස ගැනිණි. මෙය භාරතීය ආකෘතිය ම නොවුවත් එයට බොහෝ සමීප ය. මෙහි ලෝකය විනාශ කරන ඊශ්වර දෙවියන් නැත. ඒ වෙනුවට ඇත්තේ ශුද්ධ වූ ආත්මය ය. ලෝක විනාශයක් ගැන සිතීමට දඹදිව වැසියන් පුරුදු වී සිටිය ද රෝමයන් එසේ නොසිතීම එයට හේතුව වන්නට ඇත. ඒ කෙසේ වෙතත් ඒකදේවවාදයක් බහුදේවවාදී සංස්කෘතියකට අවශෝෂණයවීමක් මෙහි දී ද සිදු වී ඇත. එසේ එක් දෙවියන් වහන්සේ රෝමයන්ගේ අවශ්‍යතාවට දෙවියන් තුන්දෙනකු වුව ද ක්‍රිස්තියානිහු ඒ ත්‍රිත්වයේ ඒකත්වය අවධාරණය කළහ. යුදෙව්වන්ගෙන් ලැබුණු ඒකදේවවාදය නාමික ව වුවත් ක්‍රිස්තියානීන් රැකගත්තේ එලෙස ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva